ලියන ලද්දේ Museum Department
2017 මාර්තු 31 වෙනි සිකුරාදා, 07:02 - අවසන් යාවත්කාලීන කිරීම 2017 අප්‍රේල් 07 වෙනි සිකුරාදා, 07:33



සංරක්ෂණය කිරීමෙන් පසු මහනුවර ජාතික කෞතුකාගාරය මහජනයා සඳහා නැවත විවෘත.........

රුපියල් මිලියන 19 ක වියදමින් සංරක්ෂණමය අළුත්වැඩියා කටයුතු සිදුකරන ලද මහනුවර ජාතික කෞතුකාගාරය, ගරු නියෝජ්‍ය අමාත්‍ය පාලිත තෙවරප්පෙරුම මැතිතුමාගේ සහභාගීත්වයෙන්, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය එස්.බී.නාවින්න මැතිතුමා විසින් 2017.04.03 වන දින පෙරවරුවේ නැවත මහජනතාව සඳහා විවෘත කරන ලදි.

මහනුවර යුගයට අයත් “පල්ලෙවාහල” නමින්හැඳින්වෙන ගොඩනැගිල්ලෙහි පිහිටා ඇති මෙම මහනුවර ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලද්දේ 2015 වසරේදීය. රජුගේ අන්තපුර මාලිගය ලෙස සැලකෙන මෙම ගොඩනැගිල්ල , උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් වීමෙන් අනතුරුව ඔවුන්ගේ විවිධ කටයුතු සඳහා යොදා ගන්නා ලද අතර 1942 දී මෙහි මහනුවර ජාතික කෞතුකාගාරය ස්ථාපිත කරන ලදී. එදා මෙදා තුර මෙම ගොඩනැගිල්ලේ විශාලතම ප්‍රතිසංස්කරණයක් සිදු කළ පළමු අවස්ථාව මෙය යි.

මහනුවර යුගයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මැනවින් පිළිබිඹු කෙරෙන ගොඩනැගිල්ල එකී වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට කිසිදු හානියක් නොවන අයුරින් සංරක්ෂණමය අළුත්වැඩියා කටයුතු සිදුකර ඇත. මෙම සංරක්ෂණමය අළුත්වැඩියාව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මධ්‍යම පළාත් කාර්යාලය විසින් සිදු කරන ලදී.

{besps}/News/2017/March/kandy{/besps}